''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 97-101

# කාන්තා අයිතිවාසිකම් හා මානව හිමිකම්

**එච්. පී. අයි. නදීෂානි**
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nadeeshaniimanga@sjp.ac.lk

**සංක්ෂේපය**
මානව හිමිකම් යනු ජාතිය, ස්ත්‍රී පුරුෂභාවය, ජාතිකත්වය, ජනවාර්ගිකත්වය, භාෂාව, ආගම හෝ වෙනත් ඕනෑම තත්ත්වයක් නොසලකා සියලු මිනිසුන්ට ආවේණික හිමිකම් වේ. මානවයාගේ පැවැත්ම හා ගරුත්වය ආරක්ෂා කොට පවත්වාගෙන යාමට ඉවහල් වන මානව හිමිකම්වල ලක්ෂණය වන්නේ එය විශ්වීය වීම, බෙදිය නොහැකි වීම, අහිමි කළ නොහැකි වීම, පැවරිය නොහැකි වීම මෙන්ම උදුරා ගත නොහැකි වී මය. මානව හිමිකම් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු දෙනාටම භුක්ති විඳිය හැකි අතර, එම සුවිශේෂී හිමිකම් යමෙක් ප්‍රතික්ෂේප කරයි ද ඔහු මනුෂ්‍යත්වය ප්‍රතික්ෂේප කරයි. නමුත් මානව හිමිකම්වල ස්වභාවය එය වුවද පුරුෂයන්ට සාපේක්ෂව බලන කල තම ස්ත්‍රීත්වයට ආවේනික තත්ත්වයන් හේතු කොටගෙන ඇයගේ අයිතිවාසිකම් කඩවන අවස්ථා සුලබ ය. මේ නිසාම ඇය විශේෂයෙන් පීඩනයට ගොදුරු වන කණ්ඩායමක් ලෙෂ අන්තර්ජාතික නීතිය මගින් හඳුනාගෙන තිබේ. ඇය බොහෝ අවස්ථාවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන අතර නිරන්තර මිනිස් ජාවාරමේ වින්දිතයෙකු බවට පත්වේ. එයට අමතරව ලොව පුරා ගැහැණුන් ලිංගික හිංසනය සහ හිරිහැරවලට මෙන්ම රැකියා ස්ථානයේ වෙනස්කම් කොට සැලකීමට ගොදුරු වේ.

**මුඛ්‍ය පද:** අයිතිවාසිකම්, කාන්තාව, මානව හිමිකම්, ස්ත්‍රීත්වය

## ප්‍රවේශය

මානවයාගේ පැවැත්ම සහ ගරුත්වය ආරක්ෂා කොට පවත්වා ගෙන යාම උදේසා උපතේදිම උරුමකර ගත් හිමිකම් විශේෂයක් ලෙස මානව හිමිකම් හැඳින්වේ. එබැවින් එය මිනිසා විසින් සමාජය තුළ කෘතිමව නිර්මාණයකර ගන්නා කුලය, ආගම, ස්ත්‍රි පුරුෂභාවය සහ ජාතිකත්වය වැනි සාධක නොසලකයි. මානව හිමිකම්වල හඳුනාගත හැකි විශේෂත්වය එයයි. එබැවින් විවිධතා නොසලකා මානවයා උපතින් රැගෙන එන මෙම අයිතිවාසිකම් සහජ අයිතිවාසිකම් (inherent rights) මූලික අයිතිවාසිකම් (fundamental rights, basic rights) ස්වභාවික අයිතිවාසිකම් (natural rights) ලෙස හැඳින්වේ.

මානව අයිතිවාසිකම්වල ස්වභාවය පිළිබඳව සලකා බැලීමේ දි එක්සත් ජාතීන්ගේ අර්ථ දැක්වීම ඉතා වැදගත් වේ. එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තියට අනුව මානව හිමිකම් යනු "සහජ අභිමානය" සහ "මිනිස් පවුලේ සියලුම සාමාජිකයින්ගේ සමාන සහ අහිමි කළ නොහැකි හිමිකම් වන අතර, මෙම මානව හිමිකම් ආරක්ෂා කිරීම ලෝකයේ නිදහස, යුක්තිය සහ සාමයේ පදනම ලෙස දක්වා ඇත (Nancy,1996). එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් පෙන්වා දෙන්නේ මානව හිමිකම් යනු මානව වර්ගයාට, ජාතිය, වාර්ගිකත්වය, භාෂාව, ආගම හෝ වෙනත් ඕනෑම තත්ත්වයක් නොතකා, ජීවිතය සහ නිදහස සඳහා ඇති අයිතියි, වහල්භාවය සහ වධහිංසාවලින් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, වැඩ කිරීමට හා අධ්‍යාපනයට සහ තවත් බොහෝ දේ ඇතුළත් අයිතිවාසිකම් ලෙසයි. එමෙන්ම එය එක්සත් ජාතින්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ දෙවන වගන්තියේ (UDHR Article 02) දැක්වෙන්නේ ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතයක්, ජාතික හෝ සමාජ සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්වයන් වැනි කිසිදු භේදයකින් තොරව මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයේ දක්වා ඇති සියලුම අයිතිවාසිකම් සහ නිදහස සෑම කෙනෙකුටම හිමිවන බවයි. තවද, එය පුද්ගලයෙකු අයත් වන රට හෝ භූමියේ ස්වාධීනත්වය, විශ්වාසය, ස්වයං පාලනයක් හෝ වෙනත් ස්වෛරීභාවයේ සීමාවක්

යටතේ දේශපාලන, අධිකරණ බලය හෝ ජාත්‍යන්තර තත්ත්වය අනුව වෙනසක් සිදු නොකරණ බවද දක්වා ඇත (Universal Declaration of Human Rights, 1948). මේ අනුව මානව හිමිකම් විශ්වීය වේ, බෙදිය නොහැකි වේ, පැවරිය නොහැකි මෙන්ම අහිමි කිරීම හෝ පැහැර ගැනීම කළ නොහැක.

ඉහත සියලු අර්ථ දැක්වීම්වලින් පැහැදිලිවන කාරණයක් වන්නේ මිනිසාගේ පැවැත්ම ගෞරවය ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් අවශ්‍ය වන බවත්, එය කිසිදු භේදයකින් තොරව සියලු දෙනාටම භුක්තිවිඳිය හැකි බවත් ය. ඒ අනුව යමෙක් මානව හිමිකම් ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහු මනුෂ්‍යත්වය ප්‍රතික්ෂේප කරයි. මානව හිමිකම්වල ස්වභාවය එසේ වුවද සමාජයේ විවිධ කණ්ඩායම් වෙත මානව හිමිකම් ප්‍රවේශවීමේ දී එහි ස්වභාවය වෙනස් වී ඇත. මේ අතර මෙහි ප්‍රධාන මාතෘකාව වන කාන්තාවන් ඇයගේ ස්ත්‍රීත්වයේ ගති ගතිලක්ෂණ නිසාම නිරන්තර මානව හිමිකම් කඩවීමේ අවස්ථාවන්ට මුහුණ දෙනු ලබයි.

පුරුෂයාට මෙන්ම ස්ත්‍රියට ද සමාන අයිතිවාසිකම් ඇත. ඇයට ද ප්‍රචණ්ඩත්වයෙන් හා වෙනස් කොට සැලකීමෙන් තොරව ජීවත් වීමේ අයිතිය මෙන්ම ඉහළම ශාරීරික හා මානසික සෞඛ්‍යය භුක්ති විඳීමට අයිතිය ද, අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ද, දේපල අයිති කර ගැනීමට ඇති අයිතිය ද, ඡන්දය දීමට සහ සමාන වැටුපක් ලබා ගැනීමට ඇති අයිතිය වෙනසකින් තොරව හිමිව ඇත. නමුත් අවාසනාවන්ත සිදුවීම වන්නේ ලොව පුරා බොහෝ කාන්තාවන් සහ ගැහැණු ළමයින් තවමත් ලිංගිකත්වය සහ ස්ත්‍රීත්වය පදනම් කරගෙන වෙනස්කම්වලට මුහුණ දීමයි. ගෘහස්ථ හා ලිංගික හිංසනය, අඩු වැටුප්, අධ්‍යාපනයට ප්‍රවේශය නොමැතිකම සහ ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් නොමැතිකම වැනි බොහෝ ගැටලු ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවය විදහා දක්වන සාධක වේ.

ලෝකයේ මානව හිමිකම් පිළිබඳ විවිධ වූ ව්‍යාපාරයන් පිළිබඳ සලකා බැලීමේ දී ආරම්භයේ සිටම කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ ව්‍යාපාර දක්නට ලැබුණි. එමෙන්ම මෙම ව්‍යාපාර හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවයට එරෙහිව දීර්ඝ කාලයක් සටන් කර ඇත. අසාධාරණ නීති, සම්ප්‍රදායන්, සංස්කෘතිකාංග, ආදී නොයෙක් හේතු නිසා කඩවන අයිතිවාසිකම් වෙනුවෙන් ඔවුන් සටන් කරයි. නමුත් තවමත් කාන්තාව සම්බන්ධයෙන් මෙම ප්‍රශ්න විසඳී ඇති ආකාරයක් දක්නට නොලැබේ. කෙසේ හෝ කාන්තා අයිතිවාසිකම් කඩවන අවස්ථා බොහොමයක් පවතී. ඉන් කිහිපයක් පහත දැක්වේ.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ ලිංගික ලක්ෂණ මත පදනම්ව කාන්තාවන් සහ ගැහැණු ළමයින් වැඩි වශයෙන් ප්‍රචණ්ඩත්වයට මුහුණ දේ. මෙය ලෝකයෝ බොහෝ රාජ්‍යයන් ඇසුරින් පැහැදිලි වේ. විශේෂයෙන්ම යුද්ධ සහ ගැටුම් ඇති තැන කාන්තාවන් සහ ගැහැණු ළමයින් ප්‍රචණ්ඩත්වයේ අවදානමට ලක්ව ඇති අතර, ඉතිහාසය පුරාම ලිංගික ප්‍රචණ්ඩත්වය යුද්ධයේ ආයුධයක් ලෙස භාවිතා කර ඇත. උදාහරණයක් ලෙස, නයිජීරියාවේ මානව හිමිකම් සම්බන්ධ වාර්තාවලට අනුව බොකෝ හරාම් ප්‍රහාරවලින් පලා ගිය කාන්තාවන් නයිජීරියානු හමුදාව විසින් ලිංගික හිංසනයට සහ දූෂණයට ලක්කර ඇත (Amnesty international, 2022). එමෙන්ම ගෝලීය වශයෙන්, සාමාන්‍යයෙන් සියලුම කාන්තාවන්ගෙන් 30% ක් තම සහකරු විසින් ඔවුන්ට එරෙහිව කරන ලද ශාරීරික හෝ ලිංගික හිංසනය අත්විඳිති (Amnesty international, 2022). මේ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ලෝකයේ සමහර රටවල කාන්තාවන් දැඩි පීඩනයට හා හිංසනයට ලක්ව ඇත. මෙය කාන්තාවන්ගේ මානව හිමිකම් විශාල වශයෙන් කඩවීමකි.

**මිනිස් ජාවාරම**

අද බොහෝ මානව හිමිකම් කඩවීම් පිළිබඳව සාකච්ඡාකරන විට භාවිත වන වචනයක් ලෙස මිනිස් ජාවාරම Human trafficking හඳුනා ගත හැකිය. මෙය නූතන වහල් වෙළදාම ලෙසද හැඳින් වේ. සමහර දුර්වල හෝ අවදානම් රාජ්‍යයන් හි දේශපාල ආර්ථික ගැටලු එම රටේ ජීවත්වන ජනාවගේ මානුෂීය කාරණාවලට බාලපාන අතර එහිදී පීඩාවට පත් වන පිරිස් මෙම මිනිස් වෙළදාමට පහසුවෙන් ගොදුරු වේ. වර්තමානයේ හඳුනාගෙන ඇති දත්ත අනුව කාන්තාවන් සහ ගැහැණු ළමයින් මිනිස් ජාවාරම් නිසා වැඩි අවදානමකට ලක්ව ඇති කණ්ඩායම් වේ. මිනිස් ජාවාරම පිළිබඳ 2016 වාර්තාව පෙන්වා දුන්නේ ලොව පුරා සිටින සියලුම ජාවාරම්වලට ගොදුරු වූවන්ගෙන් සියයට 71 ක් කාන්තාවන් සහ ගැහැණු ළමයින් බවයි. මිනිස් ජාවාරමට ලක්වන කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගෙන් සියයට 75 ක් ලිංගික වහල් සේවය සඳහා වෙළදාම් කරනු ලැබේ (Ostling, 2018).

**ලිංගික හිංසනය සහ හිරිහැර**

ලිංගික හිරිහැර කිරීම යනු ඕනෑම අකැමැති ලිංගික හැසිරීමකි. මෙය ශාරීරික හැසිරීම් සහ හෝ නුසුදුසු ලිංගික භාෂාව භාවිතා කිරීම විය හැකිය. එමෙන්ම ලිංගික හිංසනය යනු යමෙකු ශාරීරිකව ලිංගික අතවරයකට ලක්වීමයි (Amnesty international, 2022). පිරිමින් සහ පිරිමි ළමයින් ද ලිංගික හිංසනයට ගොදුරු විය හැකි වුවද, එයින් වැඩි වශයෙන් පීඩාවට පත්වන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් ය.

**රැකියා ස්ථානයේ වෙනස්කම් කිරීම**

බොහෝ විට රැකියා ස්ථානවල ස්ත්‍රී පුරුෂභාවය පදනම්කර ගත් වෙනස්කම්වලට ලක්වන්නේ කාන්තාවන්ය. සමහර රටවල කම්කරු රැකියාවන් හි ස්ත්‍රී පුරුෂ වැටුප් පරතරයක් දක්නට ලැබේ. එකම රැකියාව සඳහා සමාන වැටුපක් ලැබීම මානව අයිතිවාසිකමක් වන නමුත් සාධාරණ හා සමාන වැටුපක් සඳහා නැවත නැවතත් කාන්තාවන්ට ප්‍රවේශය අහිමි වී ඇත. මෙය කාන්තාවන් සඳහා ජීවිත කාලය පුරාවටම මූල්‍ය විෂමතාවයකට මඟ පාදයි, ඔවුන් සම්පූර්ණයෙන්ම ස්වාධීනත්වයෙන් වළක්වයි

**කාන්තා ඡන්ද අයිතිය**

19 වැනි සියවසේ සහ 20 වැනි සියවසේ මුල් භාගයේ කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඉල්ලා ජනතාව උද්ඝෝෂණ කරන්නට පටන් ගත්හ. 1893 දී නවසීලන්තය ජාතික මට්ටමින් කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දුන් පළමු රට බවට පත්විය. මෙම ව්‍යාපාරය ලොව පුරා ව්‍යාප්ත වූ අතර, මෙම අරගලයට සම්බන්ධ සියලු දෙනාගේ උත්සාහයට ස්තුතිවන්ත වන්නට, අද කාන්තා ඡන්ද අයිතිය කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය යටතේ (1979) අයිතියකි. කෙසේ වෙතත්, මෙම වර්ධනයන් තිබියදීත්, කාන්තාවන්ට මෙම අයිතිය භාවිතා කිරීමට ඉතා අපහසු ස්ථාන තවමත් ලොව පුරා බොහෝ ඇත. උදාහරණයක් ලෙස පකිස්ථානයේ කාන්තාවන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම ව්‍යවස්ථාපිත අයිතිවාසිකමක් වුවද, සමහර ප්‍රදේශවල කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීම තහනම් කර ඇත

**ලිංගික හා ප්‍රජනක අයිතිවාසිකම්**

සෑම කෙනෙකුටම තම ශරීරය ගැන තීරණ ගැනීමට හැකි විය යුතුය. සෑම කාන්තාවකටම සහ ගැහැණු ළමයෙකුටම ලිංගික හා ප්‍රජනක අයිතිවාසිකම් ඇත. මෙයින් අදහස් කරන්නේ උපත් පාලන ක්‍රම සහ ආරක්ෂිත ගබ්සා කිරීම් වැනි සෞඛ්‍ය සේවා සඳහා සමාන ප්‍රවේශයක් හිමිවීමය. මන්ද අනාරක්ෂිත ගබ්සා නිසා ලොව බොහෝ කාන්තාවන් මරණයට පත් වී ඇත. ස්ත්‍රී දූෂණ සහ වෙනත් ලිංගික ප්‍රචණ්ඩත්වයන්, ස්ත්‍රී ලිංග ඡේදනය, බලහත්කාර විවාහ, බලහත්කාර ගැබ් ගැනීම, බලහත්කාරයෙන් ගබ්සා කිරීම හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට බියෙන් තොරව ජීවත් වීමට කාන්තාවන්ට හැකි විය යුතුය.

එමෙන්ම බාලවයස්කාර විවාහ නිසා සමහර රටවල කුඩා ගැහැණු ළමුන් විවිධ ගැටලුවලට මුහුණ පා ඇත. පසුගිය දශකය තුළ ළමා විවාහ මිලියන 25ක් වැළැක්වීය, නමුත් තවමත්, 2030 වන විට ගැහැනු ළමයින් මිලියන 150කට වඩා විවාහ වීමට ඉඩ ඇත. සෑම වසරකම ගැහැනු ළමයින් මිලියන 12ක් වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර විවාහ වෙති. ඔවුන්ගෙන් 18 වැනි උපන්දිනයට පෙර විවාහ වූවන් අතර අද ජීවතුන් අතර සිටින කාන්තාවන් සහ ගැහැණු ළමුන් සංඛ්‍යාව මිලියන 650ක් ලෙස ගණන් බලා ඇත (Ostling, 2018). ළමා වියේදී විවාහ වන ගැහැණු ළමයින් පසුව විවාහ වන සම වයසේ ගැහැණු ළමයින්ට වඩා සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත. ඛේදජනක ලෙස, ළමා මනාලියන් දරු ප්‍රසූතියේදී මරණ අවදානමට ලක් වේ. ගෝලීය වශයෙන්, වයස අවුරුදු 15 ත් 19 ත් අතර ගැහැණු ළමයින්ගේ මරණයට ප්‍රධානතම හේතුව වන්නේ ගැබ්ගැනීම් සහ දරු ප්‍රසූතියේ සංකූලතායි. (Ostling, 2018) ළමා විවාහ වැඩිම අනුපාතයක් ඇති රටවල් දහයෙන් නවයක්ම දුර්වල තත්ත්වයක පවතී.

මෙ අනුව ලොව පුරා සිටින බොහෝ කාන්තාවන් ලිංගික හිංසනයන්ට මුහුණ දේ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් විසින් ඔවුන්ගේ ලිංගික හා ප්‍රජනක අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කරමින් සිටී. කෙසේ හෝ සමහර රටවල් මේ සම්බන්ධයෙන් නැවත සිතා බලමින් සිටී ඒ අනුව පෝලන්තය, ආර්ජන්ටිනාව, උතුරු අයර්ලන්තය සහ දකුණු කොරියාව මෑතක සිට කාන්තා ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් සම්බන්ධයෙන් නැවත සලකා බැලීම් සිදු කර ඇති අතර එහි විශාල ප්‍රගතියක් ලබා ඇත. කෙසේ හෝ කාන්තාවගේ මෙම තත්ත්වය සලකා අන්තර්ජාතික වශයෙන් ඇය ආරක්ෂා කිරීමට පියවරයන් ගෙන ඇත. මෑත ඉතිහාසයේදී අපට දක්නට ලැබුණු සුවිශේෂ ලක්ෂණයක් නම් කාන්තාවන් වෙනුවෙන්ම සැකසුණු මානව හිමිකම් නීති මෙන්ම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පොදුවේ

ආවරණය කරන මානව හිමිකම් නීති ද අඩංගු පුළුල් නීති දේහයක් දක්නට තිබීමයි. එසේම රාජ්‍යයන් මෙන්ම නොයෙකුත් අන්තර්ජාතික සංවිධානද, දේශීය රාජ්‍ය නොවන සංවිධානද පුළුල් ලෙස තම අවධානය කාන්තාවන්ගේ මානව හිමිකම් සුරැකීමෙහිලා යොමු කරන බව පෙනේ.

කාන්තාව පුරුෂයන්ට සාපේක්ෂව බලනකල තම ස්ත්‍රීත්වයට ආවේනික තත්වයන් හේතු කොට ගෙන පීඩනයට පත්වීමට ඇති හැකියාව ඉහළය. ඒ නිසා ඔවුන් විශේෂයෙන් පීඩනයට ගොදුරු වන කණ්ඩායමක් ලෙස (Special vulnerable group) අන්තර්ජාතික නීතිය මගින් හඳුනාගෙන තිබේ. මේ තත්වයට ප්‍රතිකර්ම සැලසීම සඳහා කාන්තාවන් වෙනුවෙන් විශේෂ නෛතික ලේඛන සකස්වනු අපට නිරීක්ෂණය කළ හැකිය. එනම්,

1. කාන්තාවන් විශේෂයෙන් ආරක්ෂා කිරීම සඳහා වන සම්මුතීන් (Protective treaties) මේ යටතේ ඇතිකරන සම්මුතීන් තුළින් පුරුෂ පක්ෂයට වඩා සුවිශේෂ නෛතික රැකවරණයක් කාන්තාවට සැලසීම අරමුණු කරගත් සම්මුතීන් සකස් වනු දැකිය හැකිය.
2. කාන්තාවන්ට ඓතිහාසිකව සිදුවූ නෛතික ඌණතා නිවැරදි කිරීම අරමුණු කොටගත් සම්මුතීන් (Corrective Treaties) මෙබඳු සම්මුතීන්වලදී පුරුෂයන් භුක්ති විඳින නෛතික රැකවරණය ගැන සඳහන් නොකරන නමුත්, එම සම්මුතිය සඳහන් ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ට මෙතෙක් භුක්ති විඳීමට නොලැබුණු අයිතිවාසිකම් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන අන්තර්ගත කර තිබෙනු පෙනෙයි.
3. කාන්තාවන්ට සිදුවන වෙනස්කම් පිටුදැකීම සඳහා වන සම්මුතීන් Non discrimination treaties කාන්තාවන්ට රැකවරණය සලසන අන්තර්ජාතික නෛතික ප්‍රතිපාදන අතරින් අද වඩාත් කථාබහට ලක්ව තිබෙන වර්ගීකරණය වන්නේ වෙනස්කම් පිටුදැකීම සඳහා ප්‍රතිපාදන අන්තර්ගත නෛතික ලේඛන වේ. වර්තමානයේ බොහෝ මානව හිමිකම් සම්මුතීන්වල එක් ප්‍රතිපාදනයක් ලිංගභේදය මත පිහිටා කිසිදු වෙනස්කමකට භාජනය නොකළ යුතු බව දක්වයි. ඒ යටතේ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීම අරමුණු කරගත් සම්මුතියක් 1979 වර්ෂයේදී පනවන්නට යෙදිනි. එය කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කරලීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතිය ලෙස හැඳින්වේ (CEDAW)

කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ලෝකය වඩා හොඳ තැනක් බවට පත් කිරීමට ඉවහල් වේ. මන්ද පුරුෂ පාර්ශවය මෙන්ම ස්ත්‍රිය ද සමාජ ආර්ථික වශයෙන් දක්වන දායකත්වය සමාන වන බැවිනි. ඇයට ලබාදෙන ගරුත්වය අභිමානය ලෝකයේ සංවර්ධනයට හේතු වේ. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම එහි ඉලක්කයක් පමණක් නොව, තිරසාර සංවර්ධනය, ආර්ථික වර්ධනය සහ සාමය සහ ආරක්ෂාව සඳහා යතුරකි". එය ලෝකය වඩාත් හොඳ තැනක් බවට පත් කරනු ලබයි.

### ආශ්‍රිත ග්‍රන්ථ


Amnesty International, (2022).Women's rights are human rights [Online] Available at https://www.amnesty.org/en/what-we-do/discrimination/womens-rights (Accessed 25 September 2022 ).

Global Fund for Women's (2022) What are women's human rights? [Online] available at https://www.globalfundforwomen.org/womens-human-rights/ (Accessed 27 September 2022).

Leeuwe. F, V (2013). Women's rights are human rights: the practice of the United Nations Human Rights Committee and the Committee on Economic, Social and Cultural Rights. Cambridge University Press: United Kingdom

Ostling, K. (2018) .Violence Against Women: 6 ways women's human rights are violated around the world. [Online] available at https://canwach.ca/article/violence-against-women-6-ways-womens-human-rights-are-violated-around-world/(Accessed 05 October 2022).

Roberts. C, J. (1990). Violence against Women as a Violation of Human Rights. Journal of *Social Justice*, Vol. 17, No. 2 (40), pp. 54-70.

Nancy, F (1964) Human rights here and now [online] available at http://hrlibrary.umn.edu/edumat/hreduseries/hereandnow/Part-1/united-nations.htm (Accessed 25 October 2022).

United Nations, (2022). Human Rights. [Online] Available at https://www.un.org/en/global-issues/human-rights (Accessed 25 October 2022)

United Nations, (2014). Universal Declaration of Human Rights. [Online] available at https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights (Accessed 03 October 2022 ).

Unites Nations, (2014). Women's rights are Human rights. United nation: United Nations Publication